# සුදු කෝට් හාමිගේ කතා වස්තුව



ශ්‍රීලාල් සෙනෙවිරත්න

උතුරේ යුද්ධය නිමාවී ගතව ඇති කාලය දස වසරකට ආසන්නය. එහෙත් යුද්ධයේ සෘජු ඵල ලෙස උතුරේ දෙමළ සමාජයේ පැනනැඟි ප්‍රමුඛ ගැටළුවලට සාර්ථක විසඳුම් ලබාදීමට යුද්ධය ජයගත් දේශපාලන බල අධිකාරියට තවමත් හැකිවී නැත. ඔවුන් කෙරෙන් ඒ පිළිබඳ ප්‍රමාණවත් උනන්දුවක් ප්‍රකට කෙරෙන්නේද නැත.

උතුරේ දෙමළ සමාජයට සෘජුව සිදුකළ හානියට නොදෙවෙනි හානියක් දකුණේ සිංහල සමාජයට වක්‍රව සිදුකරනු ලැබුවේද ඒ යුද්ධයෙන්මය. එමගින් සිංහල-බෞද්ධ සංස්කෘතියේ හර පද්ධතිය, කේන්ද්‍රීය වෙනස්කම් රැසකට ලක් කෙරුණි. එහි ස්වරූපය බරපතල විකෘතියකට ලක් කෙරුණි. එය යළි ප්‍රකෘතිමත් කිරීම සඳහා යුද ජයග්‍රාහකයාගේ ප්‍රමාණවත් උනන්දුවක් තබා අවම අවධානයක් හෝ යොමුවී නොතිබීම කණගාටුදායකය. ඊටත් වැඩි ඛේදවාචකය වන්නේ එය තවතවත් විකෘති කෙරෙන දිසාවක් වෙතට තල්ලු කෙරෙමින් පැවතීමය.

යුද්ධය විසින් සිංහල-බෞද්ධ සංස-කෘතියේ මුහුණුවර කෙතරම් බරපතල විකෘතියකට ලක්කොට තිබේද යන්න පිළිබඳවන එක් චූල නිදර්ශනයක් මේ කතා වස්තුවේ ඇතුළත්ය. මෙහි කථකයා සිංහල-බෞද්ධ සංස්කෘතිය නියෝජනය කරන ප්‍රකට විදුහලක නවක ගුරුවරයෙකි. ඔහු සිප් සතර කළ අවදියේ එම විද්‍යාලයේ සිටි ජාතික ඇඳුමින් සැරසුණු, ශාන්ත පෙනුමෙන් යුත් 'මුල්ගුරුතුමා' ඔහු ගුරුවරයෙකු ලෙස එම විද්‍යාලයේම සේවයට පැමිණෙන විට ඔහුට හමු නොවේ.

එහිදී ඔහුට හමුවන 'විදුහල්පතිතුමා' යුද හමුදාවේ කොමිසන් ලත් නිලධාරියෙකි. ඔහු පාසලට පැමිණෙන්නේද, පාසලේ හැසිරෙන්නේද 'මුල් ගුරුතුමා' මෙන් නොව හමුදා කඳවුරක අණදෙන නිලධාරියෙකු ආකාරයෙනි. ඒ අරඹයා නවක ගුරුවරයාගේ සිත තුළ හටගන්නා විරෝධාකල්ප ප්‍රකාශයට පත් කිරීමෙන් ඔහුට මුහුණ පෑමට වන අකරතැබ්බය මෙහි දැක්වේ. '2015 ජනවාරි 8 වෙනස' නොවන්නට මෙහි එන විදුහල්පතිවරයා දුර දක්නයක් පමණක් නොව පිස්තෝලයක්ද ඉනේ ගසාගෙන පාසලට පැමිණෙන්නෙකු වන්නට ඉඩ තිබුණු අතර ගුරුවරයාගේ ඉරණමද මීට බොහෝ වෙනස් ආකාරයෙන් විසඳීමට ඉඩ තිබිණ.




''මැම්බර්ට වැඳ වැඳ ළඟ දෙකට නැමීගෙන
පොඩි වුන්ට දාන ගැම්බර් අපි ඉන්නේ
බලාගෙන
නොවැම්බර් මාසේ කෙම්මුර වැඩියි පුතෝ
බලාගෙන
නොම්බර් එකේ වීරයොත් ගියෙ අපෙන්
කෙළෝගෙන''

මගේ මුල්ම පත්වීම මට ලැබුණේ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයට. ඒක මම ඉගෙන ගත්ත ඉස්කෝලේ. මම ඒ ඉස්කෝලෙට ගිහිල්ලා ටික කාලෙකින් තමයි මේ විදුහල්පතිතුමා පැමිණියේ. එතුමා හමුදා සේවයේ වැඩ කළ කර්නල්වරයෙක්. අධ්‍යාපන ඇමැතිතුමාත් ආදි ශිෂ්‍යයෙකු වන මේ පාසලේ තිබුණු දේශපාලන වටපිටාව ගැන අමුතුවෙන් කියන්න ඕනේ නැහැ. එහි තිබුණු වටපිටාව අනෙකුත් පාසල් එක්ක සන්සන්දනය කරන්න අමාරුයි.

මම පාසල් යන කාලේ ඉඳලම කවි ලියනවා. විශ්වවිද්‍යාලේ ඉගෙන ගන්න කාලෙත් කවි ලිව්වා. දැනුත් කවි ලියනවා. ඒ කවි ලියන්නේ මට ඇසෙන පෙනෙන දේවල් එක්කයි. පාසල් යන කාලේ අහපු දැකපු දේවල් ගැන ඒ කාලේ කවි ලිව්වා. විශ්වවිද්‍යාලෙ ඉන්න කාලේ අහපු දැකපු දේවල් එක්ක කවි ලිව්වා. දැන් මම කවි ලියන්නේ පාසල් ගුරුවරයෙක් විදිහට අහන දකින දේවල් එක්කයි. ළමයින් ගැන. අධ්‍යාපනයට සම්බන්ධ දේශපාලනය ගැන. එහෙම නැතිව අපිට නොපෙනෙන නොඇසෙන දේවල් ගැන කවි ලියන්න අදහස් එන්නේ නැහැනේ.

මම දැන් ලියන කවි පලකරන්නේ මගේ ෆේෂ් බුක් ගිණුමේ. මට කාටවත් මඩ ගහන්න වුවමනාවක් තිබුණා නම් වැරදි දේවල් දාන්න උවමනාවක් තිබුණා නම් වෙනත් නමකින් කරන්න තිබුණා. නමුත් මට එහෙම අදහසක් නැති නිසා තවමත් මම ලියන කවි පලකරන්නේ මගේ නමින්. මේ විදිහට ලියපු කවි ගොඩක් දැනටත් මගේ ෆේෂ් බුක් ගිණුමේ තියනවා.

මේ විදිහට යන අතරේ මට විරුද්ධව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විමර්ශණයක් ආරම්භ කෙරෙනවා. විමර්ශන කණ්ඩායමක් එනවා මාව හමුවෙන්න. ඇවිල්ලා මගෙන් ප්‍රශ්න කරනවා. ඒ අය මගෙන් අහන්නේ ''-ඇයි ෆේෂ් බුක් එකේ කවි ලියන්නේ ?'' කියලා. ඒකට ඉතිං මට උත්තරයක් නැහැ දෙන්න. ඊළඟට අහන්නේ ''ඔබ ලියන කවිවලින් පාසල සහ අධ්‍යාපන අමාත්‍යාංශය විවේචනය වෙනවා නේද ?'' කියලා. ඉතිං මොකද කියන්නේ ? විවේචනය වෙනවා තමයි. කවි ලියන්නේ විවේචනය කරන්න. නැත්නම් කවි ලියන්නේ නෑනේ. ඔය විදිහට දිගින් දිගටම ෆේෂ් බුක් කවි ගැන ප්‍රශ්න අහන නිසා ඒ එකින් එකට උත්තර දෙනවට වඩා මට ලේසි වුණා මගේ ෆේෂ් බුක් පිටුව ඒ අයට පෙන්වන එක. ඉතිං මම ඒ විමර්ශන කණ්ඩායමට පෙන්නුවා මේන්න මේවා තමයි මම ලියලා තියන කවි කියලා.



විමර්ශන කණ්ඩායමෙන් මොකුත් විශේෂ ප්‍රතිචාරයක් ආවේ නැහැ. මගේ ප්‍රකාශ සටහන් කරගෙන ගියා. ටික දවසකින් මට ස්ථාන මාරුවක් ලැබෙනවා (2017 ජුනි 12වෙනිදා). ඇත්තවශයෙන්ම සිදුවුණේ මාරුවීම වෑන් එකකින් ඉස්කෝලෙටම ගෙනල්ලා දීපු එකයි. ඒ ලිවුමේ තියෙන්නේ සේවා අවශ්‍යතාවක් මත නාරම්මල මයුරපාද විද්‍යාලයට මාරු කරනවා කියලා. මේ මාරුවීම ලැබුණාට පස්සේ ගුරු සංගමය මාධ්‍ය නිවේදනයක් නිකුත් කළා. ඒකෙන් කලබල වෙලා අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් සයිට් එකේ මාධ්‍ය නිවේදනයක් දානවා කවි ලියපු ගුරුතුමා සම්බන්ධයෙන් මාධ්‍යවල පලවෙන තොරතුරු වැරදියි. මේ මාරුවීම සේවා අවශ්‍යතාවක් සඳහා කළ එකක් කියලා. මම ඒ මාරුවීම අනුව මයුරපාද විද්‍යාලයට ගිහිල්ලා දැන් මාස දෙකයි. තවම මට ටයිම් ටේබල් එකක් නැහැ. තවමත් මම මයුරපාද විද්‍යාලයේ අතිරික්ත ගුරුවරයෙක්. එච්චර හදිසි සේවා අවශ්‍යතාවකට මාව මාරු කළා

44 වන පිටට